# ස්වාමිවාක් ආරාධනාව - 22 වන පාඩම

(01) පාඩමේ සඳහන් වන ගිතිකාව කිතුනුවන් එදිනෙදා උච්චාරණය කරන කිනම් යාච්ඥාවක් හා සමාන වන්නේද?

(02) මෙම ගිතිකාව රචනා කළේ කවුරුන් විසින්ද?

(03) මෙම යාච්ඥාව තුළින් දෙන පුර්වාදර්ශය කුමක්ද?

(04) මෙම යාච්ඥාව අපට ලැබුණ අකාරය ලුක් 11:1 අනුව ලියන්න.

අ) එම යාච්ඥාව උගන්වන්නට කීවේ කවුරු විසින්ද?

ආ) මෙම ඉල්ලීම කරන විට ජේසුස් වහන්සේ නිරතවෙමින් සිටියේ කුමන ක්‍රියාවකද?

ඇ) එම ඉල්ලීම කිරීමේදී ප්‍රකාශ කළ වචන ලියන්න.

ඈ) එම යාච්ඥාව ජේසුස් වහන්සේ උගන්වා ඇත්තේ කාගේ ඉල්ලීම අනුවද?

ඉ) එම යාච්ඥාව සඳහන්වන ශුභාරංචි දෙක කුමක්ද?

(05) මතෙව් 6:8-13 සඳහන් මනුෂ්‍ය අප එකිනෙකාගේ ඉල්ලීම්/අවශ්‍යතාවයන් දෙවියන් වහන්සේ අප ඉල්ලන්නට පෙර දන්නා බවට සඳහන් දේව වචනය අඩංගු පදය ලියන්න.

(06) මතෙව් 6:8-13 යාච්ඥාව කට පාඩම් කරගෙන පහත සඳහන් වාක්‍ය වලට පිළිතුරු ලියන්න.

අ) එහි ලා පළමු පදය වන ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණන් යන්නෙහි කතෝලික සභා ධර්මෝපදේශය(2798,2802) අනුව තේරුම නැතහොත් අරුත කුමක්ද?

1) අපට පියාණන් වහන්සේව එළිදරව් කර ඇත්තේ කවුරුන් විසින්ද?

2) දෙවියන් වහන්සේට අපගේ පියාණෙනි කියා ඇමතීමට අපට හැකියාව ලැබී ඇත්තේ කුමන කරුණක් නිසාද?

3) "ස්වර්ගයෙහි වැඩ සිටින" යන වචන උච්චාරණය කිරීමේ දී අදහස් කරන්නේ කුමක්ද?

(07)අ) මෙම යාච්ඥාව ප්‍රධාන කොටස් කීයකට බෙදිය හැකිද?

ආ) ඒ ඒ කොටස් යටතේ ප්‍රධාන කරුණු කොතරම් ප්‍රමාණයක් තිබේද?

ඇ) ඒවා නම් කරන්න.

(08) එම යාච්ඥාවේ පළමු පැතුම - **"ඔබවහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා"**

අ) දෙවියන් වහන්සේගේ ශ්‍රී නායමට ගෞරවය දක්වන්නේ කෙසේද?

ආ) ඒ සඳහා අප කෙසේ ක්‍රියා කළ යුතුද?

(09) එම යාච්ඥාවේ 2 වන පැතුම - **"ඔබවහන්සේගේ රාජ්‍යය පැමිණේවා"**

අ) මෙය සම්බන්ධ වන්නේ කුමකටද?

ආ) මෙය උච්චාරණය කිරීමෙන් අප ඉල්ලන්නේ කුමක්ද?

(10) එම යාච්ඤාවේ 3 වන පැතුම -"**ඔබවහන්සේගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් මෙලොවෙහිද ඉටුවේවා**"
මෙහි තේරුම කුමක්ද? නැතහොත් මේ සඳහා අපගේ යුතුකම කුමක්ද?

(11) මෙම යාච්ඤාවේ 1 වන ඉල්ලීම - "**අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව**"
අ) මෙහි සඳහන් භෝජනය යන්නෙන් අදහස් කරන කරුණු 2 ලියන්න.
ආ) එම කරුණු 02න් එකක් වන අධ්‍යාත්මික ආහාරය යනු මොනවාද?
ඇ) මෙම කරුණු 2න් ඉල්ලුම් කරන ශාරීරික හා ආත්මික ආහාර මොනවාද?

(12) මෙම යාච්ඤාවේ 2වන ඉල්ලීම :- "**අපට වැරදි කරන අයගේ වැරදි අප කමාකරන්නාක් මෙන් අපගේ වැරදිද කමා කළ මැනව.**"
අ) මේ මගින් අප ඉල්ලුම් කරන්නේ කුමක්ද?
ආ) මේ මගින් අපට දෙන පණිවිඩය කුමක්ද?

(13) මෙම යාච්ඤාවේ 3වන ඉල්ලීම - "**පාප අවස්ථාවන්ට හසුවීමට අපට ඉඩ නොදී**"
මෙම ඉල්ලීම තුළින් ඉල්ලුම් කරන කරුණු තුන(03) ලියන්න.

(14) මෙම යාච්ඤාවේ 4වන ඉල්ලීම - "**අයහපතින් අප මුදා ගත මැනව**"
මෙම ඉල්ලීම තුළින් ඉල්ලුම් කරන්නේ කුමක්ද?

(15) මෙම යාච්ඤාවේ අවසානයේදී උච්චාරණය කරනු ලබන "**ආමේන්**" වචනයේ තෙරුම කුමක්ද?

(16) අ) මෙම යාච්ඤාව සාරංශයක් වන්නේ කිනම් ශුභාරංචියකටද?
ආ) මෙම යාච්ඤාවේ විශේෂත්වය කුමක්ද?
ඇ) මෙම යාච්ඤාව පිරිපූර්ණ යාච්ඤාවක් වන්නේ ඇයි?

(17) කතෝලික සභා ධර්මෝපදේශය 2797 අනුව පරමණ්ඩල යැදුම යාච්ඤා කළ යුත්තේ කෙසේද?

(18) අ) මෙම යැදුම අප උච්චාරණය කිරීමේ දී අපට ආරාධනා කරන නිවැරදි ඉරියව්ව කුමක්ද?
ආ) නිවැරදි ඉරියව්වකින් දෙවියන් වහන්සේ ඇමතීමට හේතුව කුමක්ද?

(19) ස්වමිවාක් ආරාධනාවේ ව්‍යුහයේ ප්‍රධාන කරුණු 5 හා ඊට අදාළ යාච්ඤාවේ වාක්‍යයන් ලියන්න.

(20) අ) ස්වාමිවාක් ආරාධනාව උච්චාරණය කිරීමට පෙර අප විසින් ඉෂ්ඨ කළ යුතු කරුණ කුමක්ද?
ආ) මෙම යැදුමේ බල මහිමය අත්දැකීම සඳහා මෙම යැදුම යාච්ඤා යුත්තේ කෙසේද?
(ඉල්ලාන දේ ලැබෙන බවට විශ්වාස කරමින් මෙම හැදුම යාච්ඤා කිරීමෙන් අප අත්දකින්නේ කුමක්ද?)

(21) පාඩම අවසානයේ සඳහන් ක්‍රියාකාරකම් යටතේ ඇති ප්‍රශ්න 2 ලියන්න.

(22) ස්වාමිවාක් ආරාධනාවේ බල මහිමය අත් දකින්නට අප කී වරක් එම යාච්ඤාව දිනකට උච්චාරණය කළ යුතුද?